
ගම්මිරිස් සෙවණ පාලනයෙන්
ඉහළ අස්වැන්නක්
ආධාරක කප්පාදුවෙන්
පසට කොළ පොහොර යෙදීමෙන්
පසේ තෙතමනය ආරක්ෂා කිරීමෙන්
අනවශ්‍ය වැල් ඉවත් කිරීමෙන්
ගම්මිරිස් වැලකින් වසරකට අමු ගම්මිරිස්
කිලෝග්‍රෑම් 10ක් ලබා ගනිමු
වැඩි විස්තර සඳහා
ඔබ ප්‍රදේශයේ අපනයන කෘෂිකර්ම
ව්‍යාප්ති නිලධාරී හෝ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ හමුවන්න
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
1095, සිරිමාවෝ බණ්ඩාරණායක මාවත, පේරාදෙණිය. 081 2388651
සැකසුම - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
~~ සන්නිවේදන අංශය ~~
L 2015/10/01

## ගම්මිරිස් වගාවේ සෙවණ පාලනය කර අස්වැන්න වැඩිකර ගනිමු

ගම්මිරිස් පැළයක් සිටුවීමෙන් පසු, එය හොඳින් වැඩෙන තෙක් සෙවණ සැපයීම අවශ්‍ය වෙනවා.

එය ඵල දරණ තත්වයට පත්වූවාට පසු, සෙවණ අවශ්‍ය වන්නේ නැහැ.

ගම්මිරිස් වගාවකින් වැඩි ආදායමක් ලබාගැනීමට නම් නිෂ්පාදන වියදම අඩුකර, අස්වැන්න වැඩි කළ යුතු වෙනවා.

මෙම පරමාර්ථ දෙකම සෙවණ පාලනය කිරීම මගින් සිදු වෙනවා.

## ගම්මිරිස් වගාවක සෙවන වැඩිවීම නිසා සිදුවන අහිතකර බලපෑම්

කරල් හටගන්නා පාර්ශ්වික අතු හා දළු වැඩීම බාල වෙනවා.

මල් හට ගැනීම අඩුවීමෙන් සහ ඇට පිරීම අඩුවීමෙන් අස්වැන්න අඩුවෙනවා.

නොමේරූ කරල් හැලී යනවා.

කරලේ බර අඩුවෙනවා.

## ග්ලිරිසිඩියා සෙවණ අතු පමණට වඩා මේරීම අහිතකරයි.

එවිට අතු ඉවත්කිරීම අපහසුයි. අධික කුලියක් ගෙවා පුහුණු ශ්‍රමිකයකුගේ සේවය ලබාගැනීමට සිදු වෙනවා.

මේරූ අතු ඉවත් කරන විට වැලට සහ කරල්වලට හානි සිදුවෙනවා.

එක් ගිලිරිසිඩියා ගසකින් ලබාගත හැකි කොළ පොහොර ප්‍රමාණය අඩුවෙනවා.

අතු දික්වෙන ප්‍රමාණය අනුව මුල් පැතිරීමද වැඩිවන නිසා පොහොර සඳහා සෙවණ ගස් හා ගම්මිරිස් වැල් අතර තරගයක් ඇතිවෙනවා.

## සෙවණ ඉවත් කිරීමෙන් ලැබෙන අමතර වාසි

ප්‍රධාන වාසිය වන්නේ නොමිලේ කොළ පොහොර ලැබීමයි.

වසරකට වැලකට අමු ග්ලිරිසිඩියා කොළ පොහොර කි.ග්‍රෑ. 20ක් යෙදීමෙන් රසායනික පොහොර සඳහා යන වියදම ඉතිරි කර ගැනීමට පුළුවන්.

වැලකට ග්ලිසිඩියා කොළ පොහොර කි.ග්‍රෑ. 10ක් යොදන්නේ නම් රසායනික පොහොර සඳහා යන වියදමින් අඩක් අඩුකරගන්න පුළුවන්.

වඩාත් සුදුසු ක්‍රමය වන්නේ වරකට ග්ලිරිසිඩියා අමු කොළ කි.ග්‍රෑ. 2.5 බැගින් වැලකට වසරකට සිව්වරක් කොළ පොහොර යෙදීම සහ එම වැලටම රසායනික පොහොර මිශ්‍රණය ග්‍රෑම් 350 බැගින් වසරකට දෙවරක් යෙදීමයි.

## කොළ පොහොර යෙදීමේ වාසි

පසේ වයනය, ව්‍යුහය දියුණු වෙනවා. හිතකර ක්ෂුද්‍රජීවී ගහණය වැඩිවෙනවා.

වාතනය දියුණුවී පසේ ජලය රඳා පවතිනවා.

වැල් කහ පැහැ ගැන්වීමට එක් හේතුවක් වන වටපණුවන්ගේ ගහණය අඩුවෙනවා.

ක්ෂුද්‍ර පෝෂක ද්‍රව්‍ය පසට ලැබෙනවා. පස සෝදා යෑම පාලනය වෙනවා.

## සෙවණ ඉවත් කිරීමට සුදුසුම කාලය

මෝසම් වැසි ආරම්භවීමට සති 2 - 3 ට පෙර සෙවණ ඉවත් කිරීම සුදුසුයි.

එහෙත් වඩාත් ප්‍රායෝගික වන්නේ අස්වැන්න නෙලාගත් පසුව, වැසි ආරම්භවීමට ප්‍රථම සියළුම අතු ඉවත් කිරීමයි.

වර්ෂාව පවතින විට ග්ලිරිසිඩියා කප්පාදු කරන්නේ නම් සෙවණ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සුදුසුය.

මෙම අවස්ථාවේදී කොස්, අඹ වැනි උස් සෙවන ගස්වල අතු කඳුබාන විට ගම්මිරිස් වැල් වලට සිදුවන හානියද අඩු වෙනවා.

මෝසම් වැසි අවසානයේ අවශ්‍ය නම් රිකිලි 2 - 3ක් ඉතිරි කර අනිත් සියළුම රිකිලි ඉවත් කර වැල් මුලට දැමිය යුතු වෙනවා.

ගම්මිරිස් කරල්හි බීජ පිරීම සඳහා ආලෝකය ප්‍රමාණවත් පරිදි ගම්මිරිස් වැලට ලැබෙන සේ නොමේරූ අතු පළමු කප්පාදුවෙන් සති 6 - 8 අතර තුරදී ඉවත් කළ යුතු වෙනවා.

## ගම්මිරිස් අස්වැන්න වැඩි කර ගැනීම සඳහා

පස් සෝදා ගෙන යාම වැලැක්වීමට කටයුතු කිරීම සහ පසෙහි තෙතමනය ආරක්ෂා කරගැනීමට පියවර ගැනීම.

සෙවණ කප්පාදු කිරීම සමගම ගම්මිරිස් වැලේ කිරි මුල් වියලීමට පෙර ගම්මිරිස් වැල ආධාරක ශාකයට ලණුවලින් බැඳීම.

ගෂමුල සුද්ධකර කොළ පොහොර වටේට යෙදීම නිසා පස තෙත්ව ඇති විට රසායනික පොහොර යෙදීම.

ඉහළින් එල්ලා වැටෙන වැල් සහ බිම දිගේ දුවන පා වැල් ඉවත් කිරීම.

වැලට හිරු එළිය හා වාතාශ්‍රය ලැබෙනසේ වැලෙහි පහල කොටසෙහි අඩියක් පමණ උසට සියළුම වැල් ඉවත් කර වැල නීරෝගීව තබා ගැනීම.

විසි කැති ගැසීමෙන් වල් ශාක ඉවත් කිරීම.

සෙමින් මැලවීමේ රෝගය හෙවත් වැල් කහ පැහැවීමේ රෝගය ඇත්නම් බෝඩෝ මිශ්‍රණය යනුවෙන් හඳුන්වන ලාබදායී දිලීර නාශකය, වැලට හා පසට හොඳින් ඉසීම.







Printed at Balin @ Co. (Pvt) Ltd.